THE JOURNAL OF LANGUAGE AND CULTURE

Volume 2 - Issue I
October-November 2024

T J O L C
ISSN 2806-5395

Category: Research Article

# නුවරකලාවියේ ඓතිහාසික හෙළ සංස්කෘතික අනන්‍යතාව : පළමු භාගය

වසන්ත කේ. දිසානායක

ARTICLE DETAILS

Published Online & Printed

October 2024

*Author:*

**Wasantha K. Dissanayake**
***Professor.***
Department of Languages,
Faculty of Social Sciences and Humanities,
Rajarata University of Sri Lanka
Mihinthale
Email: *dwasanta@yahoo.com*

**Keywords:**
Nuwarakalaviya, Buddhist Civilization, Sinhalese Culture, Prosperity.

## Abstract

Nuwarakalawiya or Anuradhapura was inhabited by Mesolithic Balangoda Man, the Australoid of the present day Vadda aborigine. He was from India who possessed the horse and a knowledge of iron working. The Aborigine cultivated rice through tank irrigation and were culturally closet to the early iron age "Megalithic" man of middle and south India, and culture traits were characteristic of the north central province. (Ancient Ceylon, 1972). The Nuwarakalaviya and Sinhalese culture is inseparable concept in Buddhist Civilization in Sri Lanka. Anuradhapura or Nuwarakalaviya is marked as the milestone which is Sinhalese cultural affluence. Here, We describe many important monuments in the Anuradhapura, the remains of which still survive. The above map provided in this research study indicates their relative positions, and the index of the monuments dealt with would help find the data in the description of any given monument.

## හැඳින්වීම

වත්මන් උතුරු මැද පළාතට අයත් නුවරකලාවිය වූ කලී සිංහල සංස්කෘතියේත්, සභ්‍යත්වයේත් ආදි කඩඉම්හි තොටිල්ල ලෙස හැඳින්විය හැකිය. නුවරකලාවිය වැසියන්ගේ ජීවිතයේ හරයත් ගැඹුරත් සංස්කෘතික පුරුෂාර්ථයනුත් එකට බැඳී පවතින්නේ තත් ප්‍රදේශයේ වූ ඓතිහාසික ජන සංස්කෘතික පසුබිම හේතු කොටගෙන බැව් පැහැදිලි කරුණකි. මෙකී ආදී සිංහල සංස්කෘතිය තුළ නිධන්ගත ඉපැරණි සංස්කෘතික නෂ්ටාවශේෂයන් තත් ප්‍රදේශාශ්‍රිත ඈත ගම් දනව් තුළ අදටත් නොනැසී පැවතීම හුදෙක් සිංහල සංස්කෘතියේ අනන්‍යතාව සූචනය කරන්නක් යැයි පැවසීම සහේතුකය.

නුවරකලාවිය නමින් අතීතයේ සඳහන් කරන ලද්දේ වර්තමාන සමස්ත අනුරාධපුර දිස්ත්‍රික්කයයි. (අභයවර්ධන,1996:109) පළමු ගජබාහු රජතුමා (ක්‍රි.ව. 114- 136) විසින් තැන වූ "වනරවවි" නගරවැව (parker,1981:400) හෙවත් නුවර වැවත් (සෙනෙවිරත්න, 2002:258-259) ධාතුසේන (සිරිවීර, 2002:203)හෙවත් දාසෙන් කැලී (පූජාවලිය, 1997:779)රජතුමා (ක්‍රි.ව. 455- 473) විසින් තනවන ලද කලා වැවත් දෙවන මොග්ගල්ලාන රජු (ක්‍රි.ව. 535 - 555) විසින් නිමවන ලද පදිකටුන්නරු, (පූජාවලිය,1997:773) පදිනොරු, ධනවාපි,(මහාවංශය,2006:40 පරි ,61 ගාථාව) පදිවැව යනාදී නාමයන්ගෙන් අතීතයේදී හඳුන්වන ලද්දා වූ පදීවාපී, (පූජාවලිය,1932:34පරි) පදි වැව (chulavansaII,1953:Lxxiv11,31-38) නමින් පසුකාලයේ ප්‍රසිද්ධ වූ පදවිය වැවත් යන මහා වැව් ත්‍රිත්වයෙන් පෝෂිත ප්‍රදේශය මෙකී මහාවාපී කර්මාන්තයන්ගේ නාමයම මූලික කරගනිමින් (නුවර) වැව, (කලා) වැව, (පදවි) වැව, "නුවරකලාවිය" (Brohier,1935:3) නමින් හඳුන්වන්නට යෙදිණි.

නුවරකලාවියේ ඓතිහාසික පසුතලය මුල්ම ආර්ය සංක්‍රමණික යුගයටත් එහා වූ කාලයකට දිවයයි. ජීව විද්‍යාත්මකව ආදි ඔස්ට්‍රොලොයිඩ් නමින් හැඳින්වෙන මධ්‍යශිලා යුගයේ විසූ මානවයෝ වසර පන්දහසකට පමණ පෙරදී මෙම ප්‍රදේශයේ වාසය කළහ. මොවුන්ගෙන් පැවතෙන්නෝ ක්‍රි.පූ. 800 දී පමණ යකඩ භාවිතය, වී වගාව, කුඹල් කර්මාන්තය හා මැටි බඳුන් භාවිතය දැනසිටි ශිෂ්ටත්වයකට පත්වූ පිරිසක් වූහ. ඔවුහු චිත්‍ර අක්ෂර භාවිතය සහ විදේශ වෙළඳම පිළිබඳ දැනසිටියහ. (Deraniyagala,1972:48-169)

මින් සියවස් දෙකකට පමණ පසුව එනම් ක්‍රි.පූ. 6 වන සියවසේ සිට උතුරු ඉන්දියාවෙන් පැමිණි ආර්යයෝ ආදිවාසිකයන් මැඩ පවත්වා ජනාවාස පිහිටුවා රටේ පාලනය සියතට ගත්හ.(වික්‍රමගමගේ,2004:46) පළමුව පැමිණි ආර්ය කණ්ඩායමේ නායකයා වූ විජය විසින් තම්බපණ්ණි නගරය පිහිටුවන ලද අතර ඔහුගේ සෙසු ඇමතිවරු උපතිස්සගාම උරුවෙලගාම, උජ්ජේනිගාම, විජිතගාම හා අනුරාධගාම ආදිය පිහිට වූහ. (මහාවංශය,7පරි:39-45) අනුරාධ ඇමති විසින් මල්වතු ඔය (කදම්බනදී) නිම්නයේ පිහිටුවන ලද ග්‍රාමය අනුරාධගාම නම් විය. (මහාවංශය,7පරි:45-43) මෑතකදි සිදුකළ අනුරාධපුර ඇතුල් නුවර කැණීමක දී හමුවූ ක්‍රි.පූ. 600 - 500 ට අයත් මැටි බඳුන් කැබැල්ලක "අනුරාධ" යන

බ්‍රාහ්මී අක්ෂර ලියා තිබීමෙන් (වික්‍රමගමගේ,2004:47) ඉහතින් සඳහන් කරන ලද වංශකථාගත තොරතුරුවලට විශ්වසනීයත්වයක් ලැබේ.

පැරණි ලංකාවේ ප්‍රධානම අගනගරය වූ අනුරාධපුරය ක්‍රි.පූ. අටවන සහ සත්වන ශතවර්ෂවල සිටම ක්‍රමානුකූලව වර්ධනය වූ ස්ථානයකි. එහි නගරයක් ලෙසින් හා රාජ්‍ය පරිපාලනයේ මධ්‍යස්ථානයක් වශයෙන් සකස්වීම පිළිබඳව ප්‍රථමවරට වංශ කථාවල සඳහන් වන්නේ පණ්ඩුකාභය රජු හා සම්බන්ධ ක්‍රි.පූ. හතරවන ශත වර්ෂයට අයත් කථා පුවත්වලය. (සිරිවීර,2002:175) අවසන් යුද්ධයෙන් ජය ලැබූ පණ්ඩුකාභය කුමරු පුරාණ අනුරාධ ග්‍රාමයට පිවිස නක්ෂත්‍රකරුවන්ගේ සහ ගෘහනිර්මාණ ශිල්පීන්ගේ සහය ඇතිව එහි නගරයක් ගොඩ නැගූ අතර අනුරාධ ඇමති හට නිවාස වූ බැවින් හා අනුර නැකතින් පිහිට වූ බැවින් ද එම නුවර "අනුරාධපුර නුවර" (මහාවංශය,10පරි:37-76) නමින් හඳුන්වන්නට යෙදිණ. ක්‍රි.පූ. 4 වන සියවසේදී පණ්ඩුකාභය රජු විසින් අනුරාධ ග්‍රාමය "අනුරාධ නුවර" නමින් අගනගරයක් බවට පත් කිරීමෙන් අනතුරුව මෙය රාජකීය වාසස්ථානය සේම නව ආර්ය ජනාවාසයේ පාලන මධ්‍යස්ථානය ද විය.(ගයිගර්,1969:77) එතැන් පටන් ක්‍රි.ව. 1055 දක්වා සියවස් 15 ක පමණ කාලයක් මුළුල්ලේ ලක්දිව ප්‍රධාන රාජධානිය (අභයවර්ධන,1996:108) වූයේ අනුරාධපුරයයි. සිංහල සංස්කෘතියේත් ආගමික ශාස්ත්‍රීය හා රාජ්‍රීය ක්‍රියාකාරිත්වයේත් මූලස්ථානය මෙන්ම නිජ බිමද අනුරාධපුර රාජධානියම විය. සමස්ත රාජ්‍ය පරිපාලනයේ කේන්ද්‍රස්ථානය වූ මෙය පසුකාලීනව බිහි වූ රාජධානිවලට පූර්වාදර්ශය විය. (සන්නස්ගල,1961:12-13)

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයේදී ගුණාත්මක මෙන්ම (Qïlitatied) ප්‍රමාණාත්මක (Qïantitatiue) ක්‍රමවේදය භාවිත කෙරිණ. එහිදී පුස්තකාල පරිශීලනයෙන් ප්‍රාථමික මූලාශ්‍රය අවිනීයක මූලාශ්‍රය භාවිත කෙරිණි. එමෙන්ම සහභාගිත්ව නිරීක්ෂණය කමිටුව සාකච්ඡා සිදු කෙරිණ.

## විමසුම



අතීතයේදී අනුරාධපුර අගනුවර සිට සතරදිශාව දැක්වීම අනුව "උත්තර රට්ඨ" "පච්ඡිම පස්ස","පාචින පසය", දක්ඛිණදේස (අභයවර්ධන,1996:73) යනුවෙන් කොටස් හතරකට බෙදා පරිපාලන කටයුතු සිදුකර ඇත. මේ බෙදීම් පිළිබඳ මුල්ම සඳහන් දකින්නට ලැබෙන්නේ ක්‍රි.ව. 6 වන සියවස තරමේදීය. එනම් සිලාකාල රජු (ක්‍රි.ව. 518- 531) විසින් පාචින දේශය වැඩිමහල් පුත්‍රයාටත් දක්ඛිණ දේශය දෙවනි පුත්‍රයාටත් (ගයිගර්,1969:13) පවරා දෙනු ලැබීමෙන් පැහැදිලි වන්නේ මෙම බෙදීම් අනුරාධපුර රාජධානි යටතේ පැවැති ප්‍රධාන පරිපාලන ප්‍රදේශ බවයි. මෙකී බෙදීම් නවවන සියවස දක්වා භාවිත වී ඇත.(ගයිගර්,1969:13)

පුරාතනයේ පටන්ම රෝහණ දේශය හෙවත් රෝහණ මණ්ඩලය සහ මලය දේශය හෙවත් මලය මණ්ඩලයද (ලංකාවිශ්වවිද්‍යාලයීය ලංකා ඉතිහාසය 1,1964:12) රාජධානි වශයෙන් පැවැති බව සඳහන් වෙතත් මුල්වරට "රාජිනොරට්ඨං" ලෙස මෙම ප්‍රදේශය හඳුන්වා ඇත්තේ හතරවන කස්සප රජුගේ (ක්‍රි.ව. 898 - 914) යුගයේදීය. (මහාවංශය,52පරි:4) එහෙත් අතීතයේ සිටම මෙම ප්‍රදේශය

"රජුගේ රට" හෙවත් "රජරට" නමින් හඳුන්වන්නට ඇතැයි සිතිය හැක. (අභයවර්ධන,1996:76)

ගැමුණු රජු (ක්‍රි.පූ.161) ද්‍රවිඩයන් පරදා ලක්දිව එක්සත් කිරීමට පෙර විසූ රජවරුන්හට අනුරාධපුරය රාජධානිය වූයෙන් සිංහල රාජ්‍යත්වයේ මුල්ම ප්‍රදේශය වූයේ "රාජරට්ඨය" බැවින් මෙකී උපරාජ්‍ය ත්‍රිත්වයේ ප්‍රමුඛස්ථානය එයට හිමිවේ. (ලංකාවිශ්වවිද්‍යාලයීය ලංකා ඉතිහාසය 1,1964:12)

දොළොස්වන සියවස අවසාන භාගයේදී "රාජරට්ඨ" හෙවත් "රජරට" නාමය අභාවයට ගොස් "පතිට්ඨාරට්ඨ" යන්න භාවිතයට පැමිණ ඇත. (chulavansaII,1953:Lxxxviii-87"පතිට්ඨාරට්ඨ") යනු සිංහල පිහිටිරට යන්නෙහි පාලි පරිවර්තනයකි. (ගයිගර්,1969:13)

"පිහිටිරට" නාමය බිහිවීම පිළිබඳ හේතුව ත්‍රිසිංහලේ කඩයිම් පොතේ දක්වා ඇත්තේ මෙසේය.

"දකුණු ශෑ වහන්සේය. ලොව මහා ප්‍රාසාදය මිරිසවැටිය රුවන්වැලි සෑය ථූපාරාමය අභයගිරිය, ජේතවනාරාමය, ලංකාරාමය, මිහින්තලේ ශාඛාගිරි වෙහෙර මෙකී අටමස්ථාන පිහිටි රට නම් වන්නේය. (අභයවර්ධන,1996:96)

දක්ෂිණ දේසය හා මලය දේසය සම්බන්ධ කිරීමෙන් මායාරට බිහිවන (අභයවර්ධන,1996:73)අතර රුහුණු රට මායාරට, පිහිටි රට එකතු වී ත්‍රිසිංහලය බිහිවිය. (අභයවර්ධන,1996:71)

දොළොස්වන සියවස පමණ වනවිට අනුරාධපුර රාජධානියේ වැදගත්කම අඩුවී ක්‍රමයෙන් රාජධානි නිරිත දෙසට සංක්‍රමණය වීමට පටන් ගන්නා ලදී. සියවස් පහළොවක්

පමණ කාලයක් සිංහලයන්ගේ ප්‍රධාන රාජධානිය වුත් සිංහල ශිෂ්ටාචාරයේත්, සංස්කෘතියේත් ක්‍රියාකාරි මූලස්ථානය වූ අනුරාධපුර රාජධානියේ අවසාන සිංහල රජු වූ පස්වන මිහිඳු රජු (ක්‍රි.ව. 982- 1017) ගේ රාජ්‍ය සමයේදී පළමුවන රාජරාජ නම් වූ චෝල අධිරාජයා සිදුකළ ආක්‍රමණයත් (chulavansaII,1953:54-55) හේතුවෙන් රජරට සිංහල රාජධානිය චෝලයන්ට නතුවිය. (සිරිවීර,2002:74) පස්වන මිහිඳු රජු සොළීන් විසින් අල්ලා ගනු ලැබීමෙන් පසුව දොළොස් අවුරුද්දක් පමණ රාජ්‍ය පාලකයකු නොවූ අඳුරු යුගයක් විය. (chulavansaII,1953:54-55)

මේ යුගයේ ප්‍රථම වරට උතුරේ ද්‍රවිඩ රාජධානියක් පිහිටුවීමත් අනුරාධපුරය අවට ද්‍රවිඩ බලය නැගීමත් සිදුවිය. (ක්‍රි.ව. 1029-1076) සියවස් භාගයක් පමණ වූ කාලය සිංහලයන් අතර මෙන්ම සිංහල ද්‍රවිඩ ගැටුම් වලින් යුක්ත වූ රටේ අභාග්‍ය සම්පන්න කාල පරිච්ඡේදයක් උදාවිය. (සිරිවීර,2002:74)

ක්‍රි.ව. 1017 සිට 1070 තෙක් වූ කාලය රජරට ප්‍රදේශය චෝලයන් විසින් පාලනය කෙරුණු අතර "ජනනාථපුරම්" ලෙස ඔවුන් විසින් හඳුන්වන ලද පොළොන්නරුවට අගනුවර මාරු කරන ලදී. සොළීන් විසින් වැනසූ අනුරාධපුර රාජධානිය නැවත සිංහල රජවරුන්ගේ රාජධානියක් නොවීය. පළමු විජයබාහු රජතුමා (ක්‍රි.ව. 1058 - 1114) චෝළ ආක්‍රමණිකයන්ගෙන් රජරට මුදාගත් පසු තම රාජධානිය පොළොන්නරුවේ පිහිටුවා ගැනීමෙන් අනුරාධපුරය රාජධානිය ක්‍රමයෙන් පරිහානියට පත්වීම ඇරඹුණුබව පැහැදිලිය (සිරිවීර,2002:74).

මෙකී පසුබිම හමුවේ ක්‍රි.ව. 1017 න් පසුව සිංහලයේ පැරණි පරිපාලන හා සංස්කෘතික කේන්ද්‍රස්ථානය වූ අනුරාධපුරයෙහි වූ ජනාවාස රටාවත් ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූ වාරිමාර්ග පද්ධතියත් වෙනස් නොවී පැවැති නමුත් පෙර වූ රාජ්‍ය අනුග්‍රහය හීනවීම තුළින් වෙහෙර විහාර වාරිකර්මාන්ත හායනීයත්වයට පත්වූවා යැයි සිතිය හැක. එමෙන්ව චෝලයින් විසින් අනුරාධපුර රාජධානිය සාහසික ලෙස විනාශ කෙරුණු අතර චෝලයින් එළවා දමා පොළොන්නරුවෙහි රජ වූ පළමු විජයබාහු රජතුමා ඇතුළු බොහෝ සිංහල රජවරුන් විසින් අනුරාධපුර රාජධානියේ පැවැති වෙහෙර විහාර වැව් ප්‍රතිසංස්කරණය කළද එහි කලින් පැවැති රාජ්‍ය පරිපාලන සංකීර්ණයේ අභාවයත් රාජ්‍ය පරිපාලනයේ ප්‍රධානීන් අනුරාධපුරය අතහැර පොළොන්නරුවේ කේන්ද්‍රගත වීමත් හේතුවෙන් එකල අනුරාධපුරයේ පැරණි ශ්‍රී විභූතිය නැතිවී ගියේය. (සිරිවීර,2002:74)

අනතුරුව ක්‍රි.ව. 1215 දී සිදුවන කාලිංග මාඝගේ ආක්‍රමණය හේතුවෙන් පොළොන්නරු රාජධානියේ බිඳවැටීම සිදුවිය. සිංහල ප්‍රධානීහු ආරක්ෂාකාරී දුෂ්කර ස්ථානය කරා ගියහ. මාඝගේ ආගම් ජාති හා සංස්කෘතික විරෝධී ක්‍රියාකලාපයෙන් ජනතාව විශාල ලෙස තලාපෙලා පාලනය කළ අතර සිංහල සංස්කෘතිය දෙදරා යාමට සැලැස්විය. මේ තත්ත්වය හමුවේ රාජ්‍ය කැබලි වලට කැඩී ගියද මාඝ විරෝධී සටන් සිදුවිය. මාඝට විරුද්ධව සටන් කළ තෙවන විජයබාහු (ක්‍රි.ව. 1232 - 1236) දඹදෙණිය රාජධානිය කර ගැනීමෙන් පසු රජරට

ශිෂ්ටාචාරය නිරිත දෙසට විතැන් වීමට පටන් ගනී. මෙලෙස දහතුන්වන ශත වර්ෂයේ මැද භාගය පමණ වනවිට රජරට ජනශූන්‍ය වීමටත් පැරණි ආගමික මධ්‍යස්ථාන හා වාරිමාර්ග අභාවයට යාමටත් එම ඉදිකිරීම්වල වූ තාක්ෂණික ඥානය බිඳ වැටීමටත් වූ ප්‍රබල හේතු සාධක පිළිබඳව විද්වත්හු හේතු දක්වති. නමුත් මේ සාධක කෙරෙහි ඉතිහාසඥයින් අතර එකඟතාවයක් දක්නට නොලැබේ(සිරිවීර,2002:105-108).

## නුවරකලාවියේ වන්නි, දිසා, පත්තු, කෝරළ, පළාත් හා කොට්ඨාස

විදේශ ආක්‍රමණ මෙන්ම මාඝගේ ආක්‍රමණය ද නිසා සිදුවූ දේශපාලනික හා පරිපාලන රටාවේ බිඳවැටීමත් මේ වනවිට නිරිත දිග හා බටහිර දිග මුහුදු ප්‍රදේශ ඔස්සේ අන්තර්ජාතික වෙළඳමට සිංහල පාලකයින් පෙළඹීමත් ආදි වූ ප්‍රබල සාධක පෙළගැස්වීමෙන් අනුරාධපුරය ඇතුළු රජරට ශිෂ්ටාචාරය පිළිබඳ අවධානය අඩුවිය (සිරිවීර,2002:105-115).

රජරට ශිෂ්ටාචාරය බිඳවැටීමෙන් අනතුරුව රටේ දේශපාලන එක්සත්භාවය බිඳවැටීමත් රජවරුන්ට තවදුරටත් තම ජනතාවට ආරක්ෂාව සැපයීමට නොහැකි වීමත් යන හේතු නිසා ඒ ඒ ප්‍රදේශවාසී ජනතාවට ආරක්ෂාව, රැකවරණය සැලසීමට අර්ධ ස්වාධීන පාලකවරු හා අධිපතිවරු බිහිවූහ. මෙකී තත්ත්වය හමුවේ පැරණි ආර්ය ශිෂ්ටාචාරයට නිජබිම වූ උතුරුදිග හා ගිණිකොන දිග තැනිතලා ප්‍රදේශයන්හි "වන්නි" නමින් හැඳින් වූ ප්‍රදේශාධිපතීන් රාශියක් සිටි බව චූලවංශය, රාජාවලිය, පූජාවලිය නිකාය සංග්‍රහය වැනි මූලාශ්‍රවලින් මෙන්ම බ්‍රිතාන්‍ය යුගයේ රාජ්‍ය ලේඛනවලින් ද පැහැදිලි වේ(ශ්‍රී ලංකාවේ ඉතිහාසය 2:122-123).මෙකී වන්නි ජනයෝ වු කලී දකුණු ඉංදියාවේ සිට මෙහි පැමිණ පදිංචි වු මලබාර් ගෝත්‍රිකයෝය.

ගම්පොළ හා කෝට්ටේ රාජ යුගයන්හි මලබාරයන් දකුණු ඉංදියාව ආක්‍රමණය කිරීම හේතුවෙන් බියටපත් වු මලලයෝ මෙරටට පැමිණ සිංහල රජුන්ගෙන් හිස්ව පැවැති උතුරුමැද හා වයඹ පළාත්වල එනම් පුත්තලමේ සිට කුරුණෑගල තෙක් හා අනුරාධපුරයේ සිට පොළොන්නරුව දක්වාද වු විශාල බිම් පෙදෙසක් පාලනයට ගත් බවට සාක්ෂි බුද්ධ රාජාවලිය වන්නි රාජාවලිය තුළ අන්තර්ගතය (ධර්මදාස සහ තුන්දෙණිය, 1994:22). 16 වන සියවසේ මැද භාගය පමණ වන විට අනුරාධපුරයේ මින් පෙර ජනාකීර්ණව පැවැති පෙදෙස් ජනශූන්‍ය බවට පත්ව තිබූ බවත් මේ විසල් තැනිතලා භූමියේ තැන තැන වූ වනාන්තර අතරතුරෙහි මලබාර් ජාතිකයන් පදිංචි වූ කුඩාගම්මාන තිබුණු බවත් රොබට් නොක්ස් ද සඳහන් කර තිබීමෙන් උක්ත අදහස වඩාත් තහවුරු වේ (නොක්ස්,2005:349-350).

"වන්නි" යන පදය පාලි සිංහල හා දෙමළ මූලාශ්‍රවල විවිධාකාරයෙන් යෙදේ. ඒ අනුව "වන්නි" යනු කැලෑ බද ප්‍රදේශය, වියළි කලාපයට අයත් පාලන ප්‍රදේශය දෙමළ සහ සිංහලයන් අතර ඇති විශේෂ කුල ගෝත්‍රයක වැඩි ප්‍රදේශය යන අර්ථ ප්‍රකට වේ(දිසානායක,1996:ංස)."වඤ්ඤො" යන පදය "වන්නි" යන සිංහල පදය පාලිබසට නැගීමෙන් ඇති වූවක් විය යුතු යැයිද මතයකි (ලියනගේ,1989:135).

"වන්නිය" යන විශේෂණ පදයෙන් හඳුන්වන ප්‍රදේශය වූ කලී උතුරු ශ්‍රී ලංකාවේ එනම් යාපන අර්ධද්වීපයෙහි අනුරාධපුරය හා ත්‍රිකුණාමලය අතර වූ විශාල භූමි භාගයකි. එහෙත් මෙකී වන්නියේ සීමා මායිම් කලින් කල වෙනස්ව ඇති බව ඒ පිළිබඳ වූ ලේඛනවලින් පෙනේ. අද්‍යතන ව්‍යවහාරය අනුව කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල උතුරු කොටස් අනුරාධපුර දිස්ත්‍රික්කය හා වන්නි දිස්ත්‍රික්කය ඇතුළත් උතුරු මැද ලංකාවේ විශාල ප්‍රදේශයක් වන්නිය නමින් හඳුන්වනු ලැබේ (දිසානායක, 1996:ංස).

මෙකී ප්‍රදේශවල සිටි පාලකයෝ වරෙක දඹදෙණි ගම්පොළ, කෝට්ටේ වැනි සිංහල රාජධානිවල වූ සිංහල රජුන්ට පක්ෂපාතිකම් දැක්වූ අතර ඇතැම්විට යාපනේ ආර්යචක්‍රවර්තීගේ බලය පිළිගත්හ(ශ්‍රී ලංකාවේ ඉතිහාසය 2:122-123). දහතුන්වන සියවසේදී මධ්‍යම පාලන තන්ත්‍රය දුර්වල වී යත්ම වන්නි පාලකයන් සංඛ්‍යාව අතින් පමණක් නොව බලය අතින් ද වර්ධනය වී තත්කාලීන දේශපාලන ක්ෂෙත්‍රයේ වැදගත් තැනක් හිමි කරගෙන සිටීම වැදගත්ය(ලියනගේ,1989:136)."වන්නි" යන පදය පළමුවරට වංශ කථාවන්හි සඳහන් වන්නේ දඹදෙණියේ තුන්වන විජයබාහු රජුගේ කාලයේදීය (ලියනගේ,1989:135).මායා රටින් දෙමළුන් පලවාහැරීමට පෙර තෙවන විජයබාහු වන්නියේ රජවිය (මැන්දිස්,2006:67). ඒ බව පූජාවලියේ සඳහන් වේ (පූජාවලිය,1997:785). පළමු පැරකුම් රජු වන්නි ප්‍රදේශ තුන්සිය හැට හතරක් තම ආධිපත්‍යයට නතු කරගත් බව නිකාය සංග්‍රහයෙහි සඳහන් වේ (කුමාරතුංග,1957:20). තෙවන විජයබාහු රජුගේ පුත් දෙවන පැරකුම් රජු විසින් වන්නිය නායකයන් හා ගැටී තම ආධිපත්‍යයට නතුකර ගත් බව පූජාවලිය සඳහන් කරයි (පූජාවලිය,1997:789).දෙවන පරාක්‍රමබාහු රජුගේ පුත් බෝසත් විජයබාහු රජතුමා වන්නි රජවරු තමා යටතට ගෙන පිහිටි රට රකිනා ලෙස ඔවුනටම භාරදෙන ලදී (පූජාවලිය,1997:802).

කෝට්ටේ යුගයේ විසූ සයවන පැරකුම්බා රජු විසින් කුළවන්නීන් මැඩ පවත්වා (පැරකුම්බා සිරිත,1954:28-46පද්‍ය) තමා යටතට ගත් අතරම වන්නි දහ අටක් (ගිරා සන්දේශය,1993:137පද්‍ය) පරාජයට පත්කර ඇති බව සඳහන් වේ. මෙලෙස රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් අනතුරුව අනුරාධපුර දිස්ත්‍රික්කය වන්නි පාලකයන් යටතේ පැවති අතරම විටෙක සිංහල රජුන්ගේ ද විටෙක යාපනේ ද්‍රවිඩ රජුන්ගේ ද ආධිපත්‍ය පිළිගනිමින් සිටි මොවුහු අර්ධ ස්වාධීන පාලකයෝ වූහ.

මහනුවර රාජ්‍ය සමයේදී තත් ප්‍රදේශය "නුවර කලාවිය දිසාවනිය" නමින් හැඳින්විණ (දිසානායක,1996:12).මහනුවර පළමු රාජසිංහ රජ කළ ඔහු යටතේ පැවැති තත් ප්‍රදේශය (රාජාවලිය,1976:229)රජුගේ කේන්ද්‍රීය බල ප්‍රදේශයෙන් දුරස්ථව පැවතීම හේතුවෙන් රජුගේ රාජ්‍ය නියෝජිතයින් වන දිසාවේවරුන්ට වඩා වන්නියාර්වරුන්ගේ බලය ප්‍රබල විය (දිසානායක,1996:12). දෙවන රාජසිංහ රජු සමයේදී උඩරට රාජධානියේ උතුරු පෙදෙස කෝරළ පහකින් සමන්විතව නුවර කලාවිය දිසාවනිය නමින් පැවතිණ (නොක්ස්,2005:44).

උඩරට රාජධානියට අයත් දිසා දොළොසින් එක් දිසාවක් ලෙස "නුවර කලාවිය"

පැවතී ඇති බව ඩේවි සඳහන් කරයි (ඩේවි දුටු ලංකාව,2012:131). ක්‍රි.ව. 1551 - 1597 කාලය වනවිට ලංකාව රාජ්‍යයන් වශයෙන් කොටස් හතරකට සහ දිසා වශයෙන් කොටස් හතරකට බෙදා තිබුණි. එම දිසාවන්ගෙන් එකක් ලෙස නුවරකලාවිය පැවතී ඇත. හතර කෝරළය, මාතර, දෙනවක අධිකාරිය ඉතිරි දිසාවන් වෙයි(සිල්වා,2001:14).

1815 වනවිට උඩරට රාජ්‍යය පාලන කොටස් 21 කට බෙදා තිබුණු අතර ඉන් 12 ක් දිසා නමින් හඳුවන්වන ලදී. ඒ අතර නුවර කලාවිය ද එක් දිසාවක් ලෙස පැවතී ඇත (විමලානන්ද,1963:322). නුවර කලාවිය දිසාවනියේ පාලනය භාරවූයේ උඩරට රජතුමා විසින් පත්කරන ලද දිසාවේවරයකුටය. දිසාවේ යනුවෙන් දිසාවනිය තුළ පාලන කටයුතු මෙහෙය වූයේ මහාවන්නියා නම් වූ පාලකයාය. මහාවන්නියා මුල භාගයේදි උඩරට රජු විසින්ම පත් කරන ලද අතර පසුව එකී බලතල දිසාවේට පැවරුණි. නුවර කලාවිය දිසාවනිය අගනුවරින් දුරස්ව පිහිටීම හේතුවෙන් නුවරකලාවිය මහවන්නීන් අන්‍ය දිසාවන්වලට වඩා නිදහසක් භුක්ති වින්දහ. මහවන්නීන් යටතේ සිටින වන්නි උන්නාන්සේ නොහොත් මුදියන්සේ නම් වූ නිලධාරියා යටතේ පත්තු 16 කටද නුවරකලාවිය බෙදී තිබුණි. 1833 වනවිට පැවැති මෙම බෙදීම් දේශීය මුලාදෑනි ක්‍රමය මූලික කරගැනීමෙන් සකස් කරන ලද්දකි. නැගෙනහිර හා බටහිර වශයෙන් නුවරකලාවිය ප්‍රධාන කොට්ඨාස දෙකකට බෙදා නැගෙනහිර කොට්ඨාසය දිසාවේවරයකු යටතේ පත්තු අටකට නැවත බෙදා එම පත්තු වන්නි මුදියන්සේ, ලියනරාල, උණ්ඩියරාල, බද්දේරාලවරුන්ගේ අධීක්ෂණය යටතේ තබන ලදී. බටහිර කොට්ඨාසය මහවන්නි උන්නැහේ සහ අතපත්තු මොහොට්ටාල පත්තු අටකට බෙදා ඒවා නැවතත් වන්නි මුදියන්සේ සහ කාරියකරවන නිලධාරීන් යටතේ තබන ලදී(කරුණානන්ද,1990:17-18).

එම පත්තු මෙසේය.

**නැගෙනහිර කොට්ඨාසය**

1. කිරලව පත්තුව
2. උඳුරව පත්තුව
3. කලාගම් පත්තුව
4. මාමිනියා පත්තුව
5. මාටොඹුවා පත්තුව
6. උඩියින් කුලම පත්තුව
7. හුරුළු පත්තුව
8. මහාපොතාන පත්තුව

**බටහිර කොට්ඨාසය**

9. එප්පාවල පත්තුව
10. උලගල්ල පත්තුව
11. පරවහ පත්තුව
12. කැලේගම් පත්තුව
13. කයිල පත්තුව
14. තිලකමල්ල පත්තුව
15. නැගම්පහ පත්තුව
16. කඟල්ල පත්තුව (කරුණානන්ද,1990:138-139).

කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය යටතේදී 1834 දී නුවරකලාවිය දිස්ත්‍රික්කය පිහිටුවන ලදී. එහිදී අනුරාධපුර සහකාර ඒජන්තවරයාගේ සහයට නුවරකලාවිය බටහිර කොටසභාර මහා වන්නියා සහ නැගෙනහිර කොටස භාර උලගල්ල මහවන්නියා යන වන්නිවරුවූහ. ඔවුන්ගේ සහයට ඉහත සඳහන් පත්තු 16 භාර වන්නියා/මුදියන්සේලා සහ තුලාන් භාර කාරිය කරවන මුලාදෑනිවරු ද වූහ (කරුණානන්ද,1990:ංසස).

1838 දි උඩරට සෙසු ප්‍රදේශවල ක්‍රියාත්මක වූ දේශීය මුලාදෑනි ක්‍රමයට අනුරූපවන අයුරින් නුවරකලාවියේ පැවැති දේශීය මුලාදෑනි ක්‍රමය ප්‍රතිසංවිධානය කරන ලදී. ඒ අනුව නුවර කලාවිය දිස්ත්‍රික්කය නැගෙනහිර දකුණු හා බටහිර වශයෙන් කොට්ඨාස තුනකට බෙදා එම කොට්ඨාස රටේ මහත්තයා යටතේ තබන ලදී. ඉහතින් සඳහන් කරන ලද පත්තු, කෝරාළ වශයෙන් නම් කොට ඒවා භාර මුලැදෑනිවරු කෝරාළවරු ලෙස නම් කරන ලදහ (කරුණානන්ද,1990:ංසස). එක් එක් කෝරළයකට අයත් වු තුළාන් ප්‍රමාණය පනහක් පමණ විය (කරුණානන්ද,1990:18). ඒ මෙසේය.

**නැගෙනහිර කොට්ඨාසය - (හුරුළු පළාත)**

1. මහපොතාන කෝරළය - මහපොතාන, අඩම්පනේ, දුටුවැව,
2. කල්පේ කෝරළය - කල්පේ, කුංජුට්ටු, කුඹුක්වැව, තුලාන
3. උඩියන්කුලම කෝරළය - මැදලස්ස, අලුත්ගම,උඩියන් කුලම තුලාන
4. මාටොඹුවා කෝරළය - මාටඹුවා වැව තුලාන්
5. උලගල්ල කෝරළය - කඳු වැව, නාච්චදූව තුලාන්

**දකුණු කොට්ඨාශය - (කලාගම් පළාත)**

6. කලාගම් කෝරළය - කැලේගම, මැදලැස්ස කොරසගල්ල වැව තුලාන්

7. මාමිනියා කෝරළය - කැකිරාව, කරුක්කන්කුලම තොර වැව තුලාන්

8. උදුරව කෝරළය - කැලේගම, ඔයදලේ, මැදලැස්ස,කඳු තුලාන්

9. කිරලව කෝරළය - කැලේගම, දුනුමඩලාව, ඔයදලේ තුලාන්

10. නෑගම්පහ කෝරළය - නෑගම්පහ, කැලේගම තුලාන්

11. කහල්ල පරවහ කෝරළය - කහල්ල පරවහ තුලාන්

**බටහිර කොට්ඨාසය (නුවරගම් පළාත)**

12. කනදරා කෝරළය - කැදෑ, ඇල්ල වැව, ඇලිමැඩ වැව තුලාන්

13. කඩවත් කෝරළය - අලුත් කඩවත්, කඳු විරසෝල් කඩවත් තුලාන්

14. නුවරගම් කෝරළය - මැදගන්දහය, නුවරගම්, ගල්කඩවල තුලාන්

15. විලච්චිය කෝරළය - අන්දර වැව, විලච්චිය, කැලේගම තුලාන්

16. එප්පාවල කෝරළය - කැලේගම, ඇලිමඩ, නබඩාවැව, තිඹිරිවැව

(කරුණානන්ද,1990:139-140)

1849 දී නුවරකලාවියේ කෝරළ සංඛ්‍යාව 17 දක්වා වර්ධනය වූ අතර 1900 වනවිට මෙම මුලාදෑනි ක්‍රමය වෙනස් වන්නේ සුළු වශයෙනි. 1900 වනවිට නුවරකලාවියේ මුලාදෑනි කොට්ඨාස මෙසේය.

**හුරුළු පළාත (රටේ මහත්තයා)**

1. මහපොතාන කෝරළය (කෝරාළ)

2. කල්පේ කෝරළය

3. කුංජුට්ටු කෝරළය

4. උඩියන් කුළම කෝරළය

5. මාටොඹුවා කෝරළය

6. උලගල්ල කෝරළය

**කලාගම් පළාත (රටේ මහත්තයා)**

7. කලාගම් කෝරළය (කෝරාළ)

8. මාමිනියා කෝරළය

9. උඩුරව කෝරළය

10. කිරලව කෝරළය

11. නෑගම්පහ කෝරළය

**නුවරගම් පළාත (රටේ මහත්තයා)**

12. කනදරා කෝරළය (කෝරාළ)

13. කැදෑ කෝරළය

14. නුවරගම් කෝරළය

15. කඩවත් කෝරළය

16. විලච්චි කෝරළය

17. එප්පාවල කෝරළය

වත්මන් උතුරුමැද පළාතට අයත් මෙකී නුවරකලාවිය දිසාවනිය අනුරාධපුරය දිස්ත්‍රික්කය නමින් හැඳින්වේ. උතුරුමැද පළාත උතුරු, වයඹ, මධ්‍යම හා නැගෙනහිර පළාත් වලින් වටවී මධ්‍යම කඳුකරයෙන් උතුරුට වන්නට පිහිටා ඇත. ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් 15.9 % පමණ වූ වර්ග කිලෝමීටර් 10472 ක භූමි ප්‍රදේශයකින් යුක්ත උතුරු මැද පළාත විශාලත්වයෙන් ශ්‍රී ලංකාවේ පළමු වැනි විශාලතම පාලන ප්‍රදේශය ලෙස හඳුනාගත හැකිය.

විශාලත්වය (ව.කි.මී)

| | මුළු භූමි ප්‍රමාණය | මුළු ගොඩබිම් ප්‍රමාණය | අභ්‍යන්තර ජලාශ |
|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 65610 | 62705 | 2905 |
| උතුරු මැද පළාත | 10472 | | 159 |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | 7179 | | |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | 3293 | | |

වියලි කලාපීය දේශගුණයකට හිමිකම් කියන නුවරකලාවිය භූගෝලීය පිහිටීම අනුව පැතිර ඇත්තේ උත්තර අක්ෂාංශයක 8. 55 සිට 7.47 සහ නැගෙනහිර දේශාංශක 79.51

සිට 81.00 අතරේය. නැගෙනහිරින් තමන්කඩුව දිශාවට මෙන්ම බටහිරෙන් පුත්තලම හා මන්නාරම් දිශා මායිම පිහිටි මෙකී ප්‍රදේශයේ වව්නියාව දිශාවට මායිම්ව පදවිවැව සිට කුරුණෑගල දිස්ත්‍රික්කයේ මායිම් ව ඇති, පරවහගමට, සැතපුම් 122කි. මධ්‍යම පලාතේ මායිමේ ඇති ඉහළ වැලි හින්නේ සිට ගල්කන්දේ මඩුඔයට සැතපුම් 75කි. පුත්තලම් පාරේ ගලගොඩහින්නට සැතපුම් 65කි. මේ අනුව නුවරකලාවියේ වපසරිය වර්ග සැතපුම් 2808.64 වන බව මිනුම් දෙපාර්තමේන්තුවේ වාර්තා පෙන්වා දෙයි(දසනායක,1982:1-2). අතීතයේදී ශ්‍රී ලංකා පාලනතන්ත්‍රයට අනුකූල වන පරිදි නුවරකලාවිය පළාත් හා කෝරළ වශයෙන් බෙදා තිබුණු අයුරු පෙර සඳහන් කරන්නට යෙදිණි. වර්තමානයේ ද පරිපාලනය පහසුව පිණිස මේවා තුලාන රාශියකට බෙදා ඇත.

පුරාණ බෙදීම අනුව නුවරකලාවිය ප්‍රධාන පළාත් තුනකින් හා ඒ යටතේ වන කෝරළ දාහතකින්ද සමන්විත විය. ඒවා නැවත පත්තු බවට පත්විය.

| පළාත | කෝරළය | පත්තුව |
|---|---|---|
| (1).නුවරගම් පළාත | 1.නුවරගම් කෝරළය | මැදගම් දහය ගල්කඩවල<br>නුවරගම් |
| | 2.කැදෑ කෝරළය | පහළ කැදෑ වැව් ඉහළ කැදෑ |
| | 3.කනදරා කෝරළය | කඳු එළි මැද ඇල්ලෑව |
| | 4.එප්පාවල කෝරළය | එළිමැද නැබඩ තිබිරිය කලාගම් |
| | 5.කඩවත් කෝරළය | අලුත් කඩවත්<br>වීරව සෝලේ<br>කඩවත් කඳු |
| | 6.විලච්චිය කෝරළය | පිච්ච පත්තු<br>මොරගොල්ල<br>කඩවත් විලච්චිය<br>අන්දර වැව<br>ඉහළ කැලෑ ගම<br>පහළ කැලෑ ගම |
| (2).හුරුළුගම් පළාත | 7.තල්පේ කෝරළය | කුඹුක් වැව<br>ඉහළ කල්පේ<br>පහළ කල්පේ |
| | 8.කුංචුට්ටුව කෝරළය | කුංචුට්ටුව නැගෙනහිර<br>කුංචුට්ටුව බටහිර<br>පහළ කල්පේ |

| | | |
|---|---|---|
| | 9. මහපොතාන කෝරළය | දුටු වැව<br>මහපොතාන<br>අඩම්පනේ |
| | 10.උඩ්ඩියන්කුලම කෝරළය | අලුත් ගම<br>මැදලස්ස<br>උඩ්ඩියන් කුලම |
| | 11. උලගල්ල කෝරළය | වැව්<br>නාච්චදූව<br>වැව්කඳු |
| | 12. මාටොඹුව කෝරළය | මාටොඹුවා වැව<br>එගොඩ වැව<br>මාටොඹුව<br>කලාගම් පළාත |
| (03) කලාගම් පළාත | 14. උන්දුරාව කෝරළය | කඳුමැඳලස්ස<br>ඕ යදැල<br>කැලෑ ගම්<br>කිරලව |
| | 15. කිරලව කෝරළය | මැඳගලස්ස<br>කැලෑගම්ඕය<br>දැල දූනුමඩල<br>කහලපරවග |
| | 16. නෑගම්පහ කෝරළය | මැදලස්ස<br>කැලෑගම්<br>ගලේගොඩ |
| | 17. කලාගම් කෝරළය | කලාගම්<br>මැඳලස්ස වැව්<br>කොරගසගල්ල |
| | 18. මාමිනියා කෝරළය | කරුක්කන්කුලම<br>තැතිරිව<br>තෝරවැව |

අපගේ මූලික අධ්‍යයන කලාපය අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය හෙවත් නුවරකලාවියේ හුරුළුගම් පළාතේ කල්පේ කෝරළය බැවින් ඒ කෙරෙහි විශේෂ අවධානය යොමු වනු ඇත.

වර්තමානය වන විට උතුරුමධ්‍යම පළාතේ දිස්ත්‍රික්ක දෙක දිසා ලේකම්වරුන් දෙදෙනෙකු යටතේ පාලනය වන අතර අනුරාධපුර දිස්ත්‍රික්කය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස

22 කට හා එක් එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයක් ග්‍රාමසේවා වසම් හෙවත් තුලාන ගණනාවකටත් එම තුලානට අන්තර්ගතවන පරිදි ග්‍රාමයන් කිහිපය බැගින්ද බෙදා ඇත.



**උතුරුමැද පළාත් පැරණි කොඩිය**







**උතුරුමැද පළාත් සිතියම**

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


එල්ලාවල, එච්., (1968). පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය : සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

කරුණානන්ද, උක්කු බණ්ඩා, (1990). නුවරකලාවිය, 1815 - 1900, කැළණියඃ ශීලා ප්‍රින්ටින් වර්ක්ස්

කරුණානන්ද, උක්කු බණ්ඩා බ්‍රිතාන්‍යයන් යටතේ උතුරුමැද පළාත, 1900 - 1931, කොළඹඃ එස්.ගොඩගේ සහ සහෝදරයෝ

කුමාරස්වාමි, ආනන්ද. කේ, (1962). මධ්‍යකාලීන සිංහල කලා, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

දළුපොත, මහින්දකුමාර, (2005). වැව හා සංස්කෘතිය, කොළඹඃ එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

දළුපොත, මහින්දකුමාර, (2003). මුට්ටි මංගල්ලයේ වගතුග, කොළඹඃ එස්.ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, මුදියන්සේ, (1996). වන්නියේ දේවදේවතා සම්භාවය සහ ව්‍යාප්තිය, කොළඹඃ එස්.ගොඩගේ සහ සහෝදරයෝ

දිසානායක මුදියන්සේ (2003). දෙමළ හත්පත්තුවේ ඇදහිලි විශ්වාස හා ශාන්තිකර්ම කොළඹඃ එස් .ගොඩගේ සහ සහෝදරයෝ

දිසානායක ජේ.බී., (2002). උඩරට සිංහලය කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ .

පඤ්ඤානන්ද . හොරොව්පතානේ, (2000). කල්පේ කෝරලේ ඇදහිලි පුදසිරිත් කඩවතඃකරුනාරත්න ඔෆ්සෙට් ප්‍රින්ටස්

පීරිස්, රැල්ෆ්. (2001). සිංහල සමාජ සංවිධානය. බොරලැස්ගමුව : විසිදුනු ප්‍රකාශන.

බෂාම්, ඒ.එල්. (1965). අසිරිමත් ඉන්දියාව, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

බෝපේගෙදර ඒ. එම්. ආර්., (2004). විද්‍යාවෙන් ඔපවන අපගේ විශ්වාස හා ඇදහිලි නුගේගොඩඃ සරසවි ප්‍රකාශකයෝ

මානැව කේ. බී., (2004). නුවර කලාවියේ ජනමංගල්ල කොළඹඃ එස් ගොඩගේ සහ සහෝදරයෝ

රත්නායක අබේ., (1999). සමාජවිද්‍යා මානව විද්‍යා න්‍යාය, පළමු කොටස , මහනුවරඃ ප්‍රින්ටෙක් මුද්‍රණාලය

ලියනගේ, අමරදාස., (1989). මධ්‍යකාලීන ලංකා ඉතිහාසය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

විමලකිර්ති හිමි, මැද උයන්ගොඩ, (1995). සිංහල ආණ්ඩුව ,මරදානඃ අනුල මුද්‍රණාලය.

වික්‍රමසිංහ මාර්ටින, (1945). සිංහල සාහිත්‍යයේ නැගීම දෙහිවලඃසීමාසහිත තිසර ප්‍රකාශකයෝ

වික්‍රමසිංහ, මාටින්, (2005) සිංහල සාහිත්‍යයේ නැගිම සරසඃ රාජගිරිය

වික්‍රමගමගේ, චන්ද්‍ර, (2004). රජරට ප්‍රවේණිය, රජරට සංවර්ධන බැංකුවේ ප්‍රකාශනයකි.

විමලානන්ද, තෙන්නකෝන්, (1963), උඩරට මහා කැරැල්ල, 1818,තුන්වැනි කණ්ඩය. කොළඹඃ එම්.ඩී.ගුණසේන සහ සමාගම

විජේසූරිය එස්. (1997). ශ්‍රී ලංකාවේ ජන සංස්කෘතිය, නුගේගොඩඃ දීපානි මුද්‍රණාලය.

සන්නස්ගල, පුංචිබණ්ඩාර, (1961). සිංහල සාහිත්‍ය වංශය, කොළඹඃලේක්හවුස් ඉන්වෙන්ස්ට්මන්ට් පුද්ගලික සමාගම

සරච්චන්ද්‍ර එදිරිවීර, (1992). සිංහල ගැමි නාටකය, මහරගමඃ ජාතික අධ්‍යාපන ආයතනය.

සිරිපාල, නෝමන්, (1997). අලුත්සහල් මංගල්ලය, නුගේගොඩ :පියසිරි ප්‍රින්ටින් සිස්ටම් .

සිරිවීර,ඉන්ද්‍රකීර්ති, (2002). රජරට ශිෂ්ටාචාරය හා නිරිත දිග රාජධානි, කොළඹඃ දයාවංශ ජයකොඩි සහ සමාගම

සිල්වා, ටී.එම්.ජී.එස්. (2002). ලක්දිව පුරාණ කොඩි, කොළඹඃ සූරිය ප්‍රකාශකයෝ.

සෙනෙවිරත්න, අනුරාධ, (2002). පුරාණ අනුරාධපුරය, කොළඹ : එස්.ගොඩගේ සහ සහෝදරයෝ

සෙනෙවිරත්න අනුරාධ, (1995) පුරාණ අනුරාධපුර යුගය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ ඉතිහාසය, පොළොන්නරු යුගය හා කෝට්ටේ යුගය, මහරගමඃඅධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව .ග්‍රන්ථ සංස්කරණ පරිවර්තන හා අනුවර්තන ග්‍රන්ථ

එළු අත්තනගලු වංශය, (2002) (සංස්) කොන්ගස්තැන්නේ ආනන්ද හිමි නාවින්න : තරංජි ප්‍රින්ටර්ස්.

කඩයිම් පොත් විමර්ශනය, (1996) (සංස්) එම්.ඒ.පී. අභයවර්ධන සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

කංකාවිතරණිය ප්‍රාතිමොක්ෂ වණ්ණනාව, (1998). (පරි) කපිල අභයවර්ධන රාජකීය ආසියාතික සමිතිය.

ගිරා සංදේශය හා විනිස, (1993). (සංස්) සුචරිත ගම්ලත් ඒ.අධිකාරි කොළඹඃ එස්.ගොඩගේ සහ සහෝදයෝ.

ජී.සී.මැන්දිස් ගේ ලංකා ඉතිහාසයේ ආදි යුගය, (2006), (පරි) ලලිත් හීන්ගම, නුගේගොඩ : සරසවි ප්‍රකාශකයෝ.

ඩෙවි දුටු ලංකාව, (2012). (අනු) ඇල්ලේපොළ එම්.එම්.සෝමරත්න, බොරලැස්ගමුවඃවිසිනු ප්‍රකාශකයෝ, 2012.

ඩේවි දුටු උඩරට රාජ්‍ය හා එහි වැසියෝ, (2008). (පරි) වනසිංහ යසපාල ,කොළඹඃ එස් .ගොඩගේ සහ සහෝදරයෝ.

නිකාය සංග්‍රහය විවරණය බු. ව. (2501). (සංස්) මුනිදාස කුමාරතුංග, කොළඹ : රත්නකාර යන්ත්‍රාලය.

පැරකුම්බා සිරිත, (1954) (සංස්) ශ්‍රී නිකල්ස්ද සිල්වා කොළඹ : එම්.ඩී.ගුණසේන සහ සමාගම

පූජාවලිය, (1932). මාබෝපිටියේ මේධංකාර හිමි, කොළඹඃමහාබෝධි යන්ත්‍රාලය

පූජාවලිය, (1997), (සංස්)කිරිඇල්ලේ ඥානවිමල හිමි කොළඹඃ එම්.ඩී.ගුණසේන සහ සමාගම

මහාවංසය, (1996), (සංස්) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, රොබට් බටුවන්තුඩාවේ; කොළඹඃ දීපානි මුද්‍රණාලය

මහාවංශය, (2006). (සංස්) මංගල ඉලංගසිංහ කොළඹඃ ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ

රසවාහිනිය දෙක කොටස, (1999). (සංස්) සරණතිස්ස හිමි, කොළඹ : ජිනාලංකාරය යන්ත්‍රාලය.

රාජාවලිය, (1976). (සංස්) ඒ.වී.සුරවීර, කොළඹඃසීමාසහිත ලේක්හවුස් ඉන්වෙස්ට්මන්ට් සමාගම.

රොබට් නොක්ස්ගේ එදා හෙළදිව, (2005), (පරි) ඩේවිඩ් කරුණාරත්න, කොළඹඃ එම්.ඩී.ගුණසේන සහ සමාගම.

ලංකා විශ්වවිද්‍යාලයීය ලංකා ඉතිහාසය, පළමු කාණ්ඩය, පළමු භාගය, (1964), (සංස්) හේමචන්ද්‍රරාය විශ්වවිද්‍යාල මුද්‍රණාලය .

විල්හෙල්ම් ගෛගර් මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය, (1969), (පරි). ඇම්.බී. ආරියපාල, මරදානඃ ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.

Adikaram E.W. (1946), ***Early history of Buddhism in Ceylon***, Colombo: The Ceylon daily news.

Brohier,RL (1935), ***Ancient Irrigation works In Ceylon, Pt II,*** colombo ; Ceylon Government Press

Bronislaw Malinowski, (1935)' ***'Coral Gardens and their Magic;*** Study of the methods of tilling the Socio agricultural retisin the Trobiand islands - Vol 01.

Bronislaw Malinowski, ***Gestations on the manners, customs, Religious, Superstitions of Civilized and semi civilized people.***

Bauman Richard.(1992). (ed) ***folklore Cultural performances and popular Entertainments,*** New York: Oxford university press.

Bell, H.C.P. (1883), "***Sinhalese customs and ceremonies connected with paddy cultivation in the low Country"*** JRAS (CB), Vol viii, No 26, Colombo: Government press.

Begly, Vimala. (1981)***. "Excavations of Iron Age Burials at Pomparippu*** 1970,"Ancient Ceylon, No 4, Journal of the Archaeological survey Department of Sri Lanka.

Bryce Ryan , L.D. Jayasena and D.C.R. Wicramasinha,(1958) ***Sinhalese village***,Florida: university of Miami press.

***Culavamsa, Part II*** , (1953). (tr) Wilhem Geiger, and Form the Germaning to English by Mrs gumle, Colombo, The Ceylon Government information department.

Cummings, Gordon C.F. (1892). ***Two Happy years in Ceylon,*** Vol 2,London: William blackwood and sons, Edinburgn

Deraniyagala S.U, (1992). ***Pre Historic of Sri Lanka part II*** , Colombo:Archaelogy survey Department

Deraniyagala S.U. (1992) ***Pre Historic of Sri Lanka part II***, Colombo: Archaeology survey Department.

Dernniyayala,S.U. (1972) ***"Te citadel of Anuradhapura Excavation & in Gedige Area***; Ancient Ceylon II, Colombo: Published by the Commissioner of arch acology.

Dernniyayala S.U. (1989) ***" A preliminary Report"*** Ancient Ceylon, VI, Colombo; Published by the commissionaire of Archeology.

Frazer James, (1917) ***The magic arts***: London.

Frazer James, (1922) ***The Golden Bough, a history of myths and religion***, Macmillan and Co. Limited.

Ievers, R.W. (1889). ***Mannual of the North Central province in Ceylon***, Colombo: Ceylon Government printer..

Ievers, R.W. (1880). ***"Customs and ceremonies Connected With paddy Cultivation",*** JRAS (CB) Vol 6.Colombo: Government Printer Ceylon.